## සංක්ෂිප්තය

පන්ති කාමර කළමනාකරණයේ දී ගුරුවරුන් විවිධ ගැටලු හා අභියෝගයන්ට මුහුණ දීම වත්මන් පාසල් පද්ධතිය මුහුණ දෙන ප්‍රබලතම අභියෝගයකි. යහපත් පන්ති කාමර කළමනාකරණයක් ඇති කර ගැනීම හා එහි දී මුහුණ දෙන ගැටලු හා අභියෝග සාර්ථකව විසඳා ගැනීමේ මූලික වගකීම පාසලක විදුහල්පති ප්‍රමුඛ ගුරුවරුන් වෙත පැවරී ඇත.මෙම කාර්යය නිසි ලෙස ඉටුකර ගැනීම පිළිබඳ විමසා බැලීම කාලීන අවශ්‍යතාවකි.පාසලක ප්‍රාථමික අංශය කළමනාකරණය කර ගැනීම මෙහිදී අතිශය වැදගත් වේ.මෙවැනි පසුබිමක් තුළ පාසල් වල ප්‍රාථමික අංශයේ පන්ති කළමනාකරණයේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලු සොයා බැලීම පිළිබඳ සිදු කරන ලද මෙම අධ්‍යයනය සුවිශේෂ අරමුණු 4ක් ඔස්සේ මෙහෙයවනු ලැබීය.

01.පන්ති කාමර කළමනාකරණ ක්‍රම ශිල්ප පිළිබඳ ප්‍රාථමික ගුරුවරුන්ගේ දැනුවත් භාවය විමසා බැලීම.

02.පන්ති කළමනාකරණයේ දී ගුරුවරුන් හඳුනාගෙන ඇති පන්ති කළමනාකරණ ක්‍රම භාවිතයේ දී මතුවන ගැටලු අනාවරණය කර ගැනීම.

03.ගුරුවරුන් මුහුණ දෙන පන්ති කළමනාකරණ ගැටලු වලට බලපෑ හැකි හේතු හඳුනා ගැනිම.

04.හඳුනාගත් හේතු අවම කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

මෙම ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක එළඹුම ඔස්සේ පර්යේෂණ පිරිසැලසුම ලෙස සමීක්ෂණ පර්යේෂණ පිරිසැලසුම යොදා ගනු ලැබිණි.මෙම අධ්‍යයනයේ නියැදිය වූයේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව අධ්‍යාපන කොට්ඨාසයේ තෝරා ගන්නා ලද පාසල් 8කි. මෙහිදී කොට්ඨාසයේ සෑම පාසලකට ම පර්යේෂණයට ඇතුළත් වීමේ අවස්ථාව වඩාත් සාධාරණීකරණය කරණු පිණිස ස්ථරගත අහඹු නියැදි ක්‍රමය යොදා ගනු ලැබිණි. සමස්ත පර්යේෂණයේ නියැදිය ඒකක 56කි.

මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේ උපකරණ කීපයක් යොදා ගනු ලැබිණි. ඒවා නම් ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුලය,නිරීක්ෂණ පත්‍රිකා ය. එහිදී පන්තිභාර ගුරුවරුන් සඳහා ප්‍රශ්නාවලී ද අංශ ප්‍රධානීන් හා විදුහල්පතිවරුන් සඳහා සම්මුඛ සාකච්ඡා ද පන්ති කාමර නිරීක්ෂණයට නිරීක්ෂණ ෂෙඩ්‍යුල ද යොදාගනු ලැබිණි. එම දත්ත වගු හා ප්‍රස්තාර මගින් ඉදිරිපත් කළ අතර ප්‍රමාණාත්මක හා ගුණාත්මක ව විශ්ලේෂණයට ලක් කරණු ලැබිණි.

මෙම දත්ත විශ්ලේෂණය තුළින් ප්‍රස්තුත ගැටලුව ට හේතු කිහිපයක් අනාවරණය කරගත හැකි විය. පන්ති කළමනාකරණ ක්‍රම පිළිබඳ ගුරුවරුන් තුළ ප්‍රමාණවත් දැනුවත් භාවයක් පවතින බව පැහැදිලි විය. ඔවුන් මුහුණ දුන් ගැටලු වශයෙන් හඳුනාගනු ලැබුවේ භෞතික සම්පත් හිඟකම,මානව සම්පත් හිඟකම,ඉහළ නිළධාරීන්ගේ සහයෝගය ප්‍රමාණවත් නොවීම සහ විවිධ පන්ති කළමනාකරණ ක්‍රම භාවිතයේ ප්‍රායෝගික ගැටලු යන ඒවායි. මෙම කළමනාකරණ ගැටලු වලට හේතු ලෙස අවශ්‍ය ප්‍රතිපාදන ලැබීමේ දුර්වලතාව, පාසල්වල

භෞතික පරිසරයේ අවිධිමත්භාවය, විවිධ නිළධාරීන්ගේ කාර්ය බහුලත්වය ආදිය බලපාන බව අනාවරණය විය.

මෙම ගැටලු විසඳා ගැනීමට පන්ති කාමර නියමිත ප්‍රමිතියෙන් පවත්වා ගැනිම, පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව අනුමත සීමාවේ පවත්වා ගැනීම, අවශ්‍ය කළමනාකරණ සැලසුම් පෙර සූදානමකින් සකස් කර ගැනීම,විවිධ පාසල් පාර්ශව කරුවන් දැනුවත් කිරීම,වැනි උපක්‍රම යොදාගත හැකි ය.පන්ති කළමනාකරණයේ දී සමාජ වෙනස්වීම් සැලකිල්ලට ගෙන කටයුතු කිරීම,උචිත නව සංකල්ප,නවීන ක්‍රමෝපාය හා දැනුම සමග ඉදිරියට යාම වැනි ක්‍රම ගැටලු අවම කර ගැනීමට සුවිශාල වැදගත් කමක් ගන්නා බව පැහැදිලි විය. මේ අනුව මෙම අධ්‍යයනය පාසල තුළ අර්ථවත් ඉගෙනුම් ඉගැන්වීම් සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය කළමනාකරණයකට මග පෙන්වයි.

**Abstract**

One of the greatest challenge of the current school system is facing different problems and challenges by the teachers in classroom management.Creating a healthy classroom management and solving the problems and challenges are the basic reponsiblilities of the principal and the academic staff. It's a timely need to consider about fulfilling this task appropriately. Here, management of the primary section is very important. On these grounds this study was conducted focusing on four special objectives about the problems and challenges face by the teachers of primary section in schools in classroom management.

01. To investigate the knowledge of the primary teachers on the strategies of classroom management.
02. To reveal the problems arising through the application of the classroom management strategies identified by the teachers.
03. To identify the reasons for the classroom management problems faced by the teachers.
04. To present suggestions to minimize the reasons identified.

To achieve the above mentioned objectives, the survey research design was used as the research design through the quantitative approach. The sample of this study consisted of eight selected schools in Ibbagamuwa Education Division in Kurunegala District in North Western Province.To justify the equal inclusion of all schools in Ibbagamuwa Education Division the systematic sampling method was used. There were 56 units in the sample.

In this study, several instruments such as questionnaires, discussion schedules and observation schedules were used. Questionnaires for the primary class teachers, interview schedules for sectional heads and principals and also observation charts schedules for observation of the classrooms had been used. Collected data was presented through charts and tables by analyzing them both qualititatively and quantitatively. Through the analysis of data, several reasons were diagnosed for the relevant problem. It was clear that teachers were having adequate knowledge about classroom management techniques and strategies. Lack of physical and human resources, inadequate support of the high level officers and practical issues of using

different classroom management strategies were the problems faced by the teachers. As reasons for the above problems several facts could be diagnosed. They were weaknesses in supplying quality inputs, physical environment of the schools and busy work schedules of the officials.Keeping the classroom in good standard,maintaining the student number in the accepted level, prepare management plans prior preparation, making the different stakeholders aware of prevailing situation are some methods which can be used to solve the above problems. Consideration of social changes, use of suitable modern concepts, modern techniques, modern strategies and knowledge are some methods useful in minimizing the above problems in the classroom management. This study guides to a management process of the primary classroom to create a meaningful teaching learning culture in the school.